**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**
**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී සිව්වන වසර පරීක්ෂණය - පළමු සෙමෙස්තරය 2022/2023**
**SOC 4178 – වෛද්‍ය සමාජ විද්‍යාව**

**කාලය : පැ දෙකයි (02)**

**ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.**

---

1 'වෛද්‍ය සමාජ විද්‍යාවේ මූලික අවධානය යොමු වන්නේ පුද්ගලයන්ගේ සෞඛ්‍ය සහ රෝගීත්වය කෙරෙහි සමාජ-සංස්කෘතික සාධක බලපාන්නේ කෙසේද යන්න පිළිබඳවයි.' මෙම ප්‍රකාශය නිදසුන් සහිතව විවේචනාත්මකව විභාග කරන්න.

2 වෛද්‍ය නොවන ගැටළු වෛද්‍ය ගැටළු ලෙස නිර්වචනය වන්නේ කෙසේදැයි නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

3 ජීව වෛද්‍ය ආකෘතිය පුද්ගලයාගේ සමාජ - සංස්කෘතික පසුබිම හඳුනා ගැනීමට අපොහොසත් වේ. නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

4 මිෂෙල් ෆුකෝ (Michel Foucault) ගේ (1973) The Birth of the clinic: An Archaeology of Medical Perception නැමති කෘතිය කෙරෙහි විශේෂ අවධානය සහිතව, මානව සිරුර ශික්ෂණය කිරීමේ ක්‍රියාවලියේදී 'වෛද්‍ය බැල්ම' (Medical Gaze) වැදගත් වන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න.

5 1950 ගණන්වල ශ්‍රී ලංකාවට උපත් පාලන පෙති හඳුන්වාදීමේ වැඩසටහන කෙරෙහි ජනගහණ පාලනය පිළිබඳ ගෝලීය කතිකාව බලපෑම් කළේ කෙසේදැයි විස්තර කරන්න.

6 පහත සඳහන් ඕනෑම මාතෘකා **දෙකක් (02)** පිළිබඳ කෙටි රචනා ලියන්න,

(i) එච්.අයි.වී ඒඩ්ස් HIV/ AIDS සහ ක්ෂය රෝගය පිළිබඳ සමාජ නිර්ණායක

(ii) ගෝලීය දකුණෙහි ආබාධිතභාවය

(iii) ශ්‍රී ලංකාවේ නිදන්ගත වකුගඩු රෝගය

(iv) ශ්‍රී ලංකාවේ LGBTQI+ ප්‍රජාව අත්දකින සෞඛ්‍ය ගැටළු

***************